<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

<u>පැමිණිලිකරු.</u>

| | | |
|---|---|---|
| **නඩු අංකය** | : **3155/විශේෂ** | **එදිරිව** |
| **ස්වභාවය** | : **විශේෂ** | |
| **වටිනාකම** | : **රු.100,000/-** | |
| **කාර්ය පටිපාටිය** | : **සාමාන්‍ය** | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජාපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු, අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන්

සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලින් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජාපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කෂුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඉඩෙවලොපර්ස් (ලංකා) ිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

<u>විත්තිකරුවෝ.</u>

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 සහ 95 වගන්ති ප්‍රතිපාදන සලසා ඇති පරිදි ඉහත නම් සඳහන් 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් වෙත එක්වද 3 වැනි විත්තිකාර සමාගම සහ 4 වැනි විත්තිකාර සමාගම වෙත ඒ ඒ සමාගම්වල එක් එක් නීතිඥවරයා මඟින් අධිකරණයේ නියෝග මත 1992/03/06 දින දරණ විචාරණ භාර කරවන ලද හෙයින්,

ඒවාට 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් සහ 4 වැනි විත්තිකාර සමාගම විරෝධයන් නගා සිටින ලද හෙයින් ද,

ගරු අධිකරණය විසින් විමසීමකින් පසුව එම විරෝධතාවයන් ප්‍රතික්ෂේප කරමින් එම විචාරණවලට සම්පූර්ණයෙන් උත්තර දෙන ලෙසට 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට සහ 4 වැනි විත්තිකාර සමාගමට ගරු අධිකරණය විසින් නියෝග කරන ලදුව, ඒ අනුව, එම විත්තිකාර සමාගම් ගරු අධිකරණයට, එකී විචාරණවලට සිය උත්තර 1992/12/17 දින සපයන ලද හෙයින් ද,

3 වැනි විත්තිකාර සමාගම ද එකී විචාරණවලට සිය උත්තර 1992/12/17 දින සපයන ලද හෙයින් ද,

බැලූ බැල්මට, එකී විචාරණවලට සපයන ලද උත්තර, ඉහත කී එක් එක් විත්තිකාර සමාගම් මෙහි පහත දක්වා ඇති පරිදි උත්තර නොදී අත්හැර, සහ/හෝ උත්තර දීමට ප්‍රතික්ෂේප කර සහ/හෝ ප්‍රමාණවත් නොවන පරිදි උත්තර සපයා ද සමහර අවස්ථාවන්හිදී එකී විත්තිකාර සමාගම් අපැහැදිලිව සහ ප්‍රශ්ණය මඟහැර උත්තර සපයා ඇති අතර, ඒ මගින්, කවර වැදගත් යෝජිත කරුණු මත පාර්ශවකරුවන් එකඟ නොවී සිටි ද යන වග අධිකරණයට නිසැකවම දැන ගැනීමට අපහසුකර ඇති හෙයින් ද,

1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් සම්බන්ධ වන තාක් දුරට

(අ) පහත සඳහන් විචාරණාවලට හිතාමතාම උත්තරදීම ප්‍රතික්ෂේප කර ඇති සහ/හෝ උත්තර නොදී ඇත. අංක.
2, 3, 4, 5, 6, 11, 12, 13, 16, 17, 18, 19, 20 , 21, 22, 23, 24, 25, 29, 31, 34, 35, 38, 39, 40, 44, 45, 46, 47, 48, 49, 50, 51, 52, 53, 54, 55, 56, 57, 58, 59, 60, 61, 62, 63, 64, 65, 66, 67, 72, 80, 81, 85.\

(ආ) පහත සඳහන් විචාරණාවලට දී ඇති උත්තර අපැහැදිලි සහ/හෝ උත්තර දීමට මඟහැර ඇත. අංක.
27, 29, 41, 42, 68, 73.

(ඇ) පහත සඳහන් විචාරණාවලට දී ඇති උත්තර ප්‍රමාණවත් නැත. අංක.
9, 15, 17, 19, 24, 28, 32, 33, 37, 38, 43, 52, 70, 71, 76, 77, 79, 82, 84.

3 වැනි විත්තිකාර සමාගම සම්බන්ධවන තාක්දුරට,

(අ) පහත සඳහන් විචාරණාවලට හිතාමතාම උත්තර දීම ප්‍රතික්ෂේප කර ඇති සහ/හෝ උත්තර නොදී ඇත. අංක.
7, 10, 11, 13, 14, 19, 20, 21, 22, 23, 24, 25, 29, 30, 31, 32, 33, 34, 35, 37, 38, 40, 41, 42, 43, 45, 46, 48, 49, 50, 54, 55, 56, 57.

(ආ) පහත සඳහන් විචාරණාවලට දී ඇති උත්තර අපැහැදිලිය සහ/හෝ උත්තර දීමට මඟහැර ඇත. අංක.
6, 17, 26, 27, 36, 46, 52.

(ඇ) පහත සඳහන් විචාරණාවලට දී ඇති උත්තර ප්‍රමාණවත් නැත. අංක.
3, 4, 5, 39, 55, 58, 59, 64, 65.

4 වැනි විත්තිකාර සමාගම සම්බන්ධ වනතාක් දුරට,

(අ) පහත සඳහන් විචාරණාවලට හිතාමතාම උත්තර දීම ප්‍රතික්ෂේප කර ඇති සහ/හෝ උත්තර නොදී ඇත. අංක.
5, 22, 30, 31, 37, 38, 40, 41, 42, 43, 44, 45, 46, 47, 48, 56, 58, 63, 64, 65, 66, 67, 69, 70, 71, 72, 73, 74, 77, 81, 82, 83, 86, 87, 88, 92, 93, 94, 95, 96, 97, 98,

99,. 100, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 113, 114, 115, 116, 117, 118, 119, 120, 121, 122, 123, 124, 125, 127, 129, 130, 131, 132, 133, 135, 136, 137, 138, 139, 141.

(ආ) පහත සඳහන් විචාරණවලට දී ඇති උත්තර අපැහැදිලිය සහ/හෝ උත්තර දීමට මඟහැර ඇත. අංක.
3, 10, 11, 12, 13, 14, 20, 28, 29, 32, 39, 49, 50, 51, 52, 53, 54, 55, 57, 59, 78, 79, 110, 111, 112, 129, 130, 131, 132, 133, 134, 140.

(ඇ) පහත සඳහන් විචාරණවලට දී ඇති උත්තර ප්‍රමාණවත් නැත. අංක.
7, 9, 16, 18, 19, 23, 24, 25, 26, 27, 36, 76, 127.

එපමණක් ද නොව, 1987 ජුලි මාසයේ දී මෙහෙයුම් කටයුතු සඳහා හෝටලය විවෘත කලාට පසුව, 1987 දෙසැම්බර් මස හෝ එයට ආසන්නයේ දී පමණ, 4 වැනි විත්තිකාර සමාගමේ හුදෙක් මුදල් පාලක වශයෙන් මුලින් සේවයට බැඳුන සහ හුදෙක්ම ඊට පසුව 1989/12/13 වන දින හෝ එදින ආසන්නයේ දී පමණ සාමාන්‍යාධිකාරි වශයෙන් පත් කලාවූ කෙනෙකු නිසා, එකී උත්තර සපයා ඇති දිවුරුම් ප්‍රකාශක එස්.ආර්.සුදර්ශන් හුදෙක්ම එම විචාරණවලට ආශ්‍රිත කරුණු කටකථාවෙන් පමණක් දැනගත් දේ පමණක් 4 වන විත්තිකාර සමාගම වෙත භාරදුන් ඉහත කී විචාරණවලට සපයා ඇති උත්තරවල අඩංගු වේ. එමනිසා එකී විචාරණවලට ආශ්‍රිත කරුණු පිළිබඳව, ඔහුට පුද්ගලික දැනුමක් නැති අතර, තවද, 4 වන විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සලකා බලනු ලැබූ කරුණු සහ/හෝ සාකච්ඡාවලට භාජනය කලාවූ කරුණු එකී විචාරණවල අඩංගුව ඇති බැවින් සහ ඒවා 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික දැනුමට සම්බන්ධ කරුණු හෙයින් ඉහත කී දිවුරුම් ප්‍රකාශකරු 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු නොවන හෙයින් ද, එම කරුණු දිවුරුමක් මත ප්‍රකාශ කළ හැකිව නොතිබුණි.

සිය පැවැත්ම සහ/හෝ ක්‍රියා කලාපය එකී නොයෙක් විචාරණවලට ආශ්‍රිතව ඇති 4 වැනි විත්තිකාර සමාගමේ ප්‍රධාන නිලය දරණ තැනැත්තා වන, එහි සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂ 5 වැනි විත්තිකරු සහ /හෝ 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වන 7 වැනි විත්තිකරු සහ/හෝ 4 වැනි විත්තිකාර සමාගමේ රජය මඟින් නම් කර පත්කර ඇති අධ්‍යක්ෂවරයෙකු වන 10 වන විත්තිකරු විසින් මෙම විචාරණවලට උත්තර දිය යුතු තිබුණ බවත්, උත්තර දීමට හැකිව තිබුණ බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින අතර, ඒ අනුව 4 වැනි විත්තිකාර සමාගම වෙනුවෙන් එකී විචාරණ වලට නිවැරදි ලෙස සහතික කර ප්‍රකාශ කිරීමට හැකි තත්වයක සිටින පුද්ගලයින් ඔවුන්ම පමණක් වන බව පැමිණිලරකැ ප්‍රකාශ කරයි.

ඉහත කරුණු තිබෙන හැටියට ගරු අධිකරණය කාරුණිකව, අපැහැදිලි සහ/හෝ අවිනිශ්චිත සහ/හෝ ප්‍රශ්ණය මඟහැර ඇති එම උත්තර කීපය ප්‍රතික්ෂේප කරන ලෙසටත්, මෙම නඩුවේ තීරණය රඳා පවතින, විසඳිය යුතු ප්‍රශ්න වාර්ථා ගත කිරිමට කවර වැදගත් යෝජිත කරුණු මත පර්ශවකරුවන් එකඟ නොවී සිටී ද යන වග ගරු අධිකරණයට නිසැකව, දැන ගැනිමට හැකිවන සේ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වැනි වගන්තියේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි පූර්ණ ලෙස උත්තර සැපයීමට 1 වැනි සහ 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගමට හා 4 වැනි විත්තිකාර සමාගමට නියම කරන ලෙසත්, අපි අයැද සිටිමු.

මෙම ඉල්ලීමේ සඳහන් කරුණු පැමිණිලිකරුගේ නීතිඥ මහතාට 1993 ක්වූ ජනාවරි මස 22 වන දින සනාථ කිරිමට ගරු අධිකරණයට කාරුණිකව ඉඩ දෙන ලෙසටත්, අපි තවදුරටත් අයැද සිටිමු.

1993 ක්වූ ජනවාරි මස 20 වන දින කොළඹ දී ය.



පැමිණිලිකරුගේ නීතිඥවරු.